සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண சபையின் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018

| ශ්‍රේණිය | නර්තනය II | 52 | S | II | කාලය පැය 03 යි |
|---|---|---|---|---|---|

උපදෙස්:

විභාග අංකය- ..............................

* I කොටසින් ප්‍රශ්න 2 ක් හා II/III/IV කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරා ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

## I කොටස

(01)

i. "දොංතකු දොං ජිංතක තරිකිට........." මෙම බෙරපදය අදාල තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

ii. "උදුල කළ තුඟු නයන දිගු ගෙල
පබල යසහර කමල කළ රැදී......." මෙම කවි පද මාත්‍රා 3/4 තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

iii. ගොග් ගොග් ජිං ජිං ගත වට්ටමට අයත් අඩව්වක් ප්‍රස්ථාර කරන්න.

(02). දේශීය ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් ආගමික හා සමාජීය වශයෙන් බැඳී පවතී.

i. කොහොඹා කංකාරි ශාන්තිකර්මය හා බැඳී පසුබිම සමාජීය වශයෙන් වැදගත් වීමට හේතු විමසන්න.

ii. දෙවොල් මඩු ශාන්තිකර්මයෙහි එන නාට්‍යමය අවස්ථාවක භාවිත දෙබස්, සංවාද, ගායනා එහි විචිත්‍රත්වයට හේතු වේ. විමසන්න.

iii. පහන්මඩු ශාන්තිකර්මයෙහි අන්තර්ගත නර්තන අංග දෙකක් හඳුන්වා භාවිත රංග වස්ත්‍රාභරණයන්හි ආගමික ලක්ෂණ පැහැදිලි කරන්න.

(03) දේශීය ශාන්තිකර්මවල රංගවස්ත්‍රාභරණ එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණ පිළිබිඹු කෙරේ.

i. උඩරට, පහතරට හා සබරගමු ශාන්තිකර්මවල ප්‍රධාන සැරසිළි 3 ක් වෙන් වෙන් වශයෙන් හඳුන්වන්න.

ii. ඕනෑම නර්තන සම්ප්‍රදායක රංග වස්ත්‍රාභරණ කොටස් 3ක් හඳුන්වා ඒවායෙහි සුවිශේෂී බව උදාහරණ දෙමින් පහදන්න.

iii. මරු සන්නිය, අඹවිදමන යන නාට්‍යමය පෙළපාළිවලදී භාවිත අංග රචනයේ හා රංග වස්ත්‍රාභරණවල උචිතානුචිත බව පැහැදිලි කරන්න.

## II කොටස

(04) අනෙකුත් කලාවන් මෙන්ම දේශීය නර්තන කලාවට ද ඓතිහාසික සංස්කෘතික පසුබිමක් ඇත.

i. පොළොන්නරු යුගයේ නර්තන කලාව සඳහා රාජ අනුග්‍රහය ලැබී ඇති අයුරු විස්තර කරන්න.

ii. මහනුවර යුගයේ නර්තන කලාව පැවති තත්ත්වය දේශාටන වාර්තා 2 ක් උදාහරණයට ගනිමින් විස්තර කරන්න.

iii. දේශීය නර්තන කලාව භාරතීය ආභාෂය තුළින් පෝෂණය වී ඇති අයුරු අනුරාධපුර, පොළොන්නරු හා ගම්පොළ යුග ඇසුරෙන් පහදන්න.



www.Artsapi.lk

Scanned by CamScanner

(05) දේශීය නර්තන කලාව ජන සංගීතය හා බැඳී පවතී.

i. දේශීය ගැමි නැටුම් සඳහා ජන සංගීතය භාවිතය උදාහරණ සහිතව විස්තර කරන්න.

ii. කෝලම් නාටකයේ එන චරිතයන්හි චරිත ලක්ෂණ බෙර පද, කවි ගායනා හා නර්තන මගින් උද්දීපනය වන අයුරු සාකච්ඡා කරන්න.

iii. සොකරි නාටකයේ එන ගායනා මගින් එකල සමාජ සංස්ථාව ප්‍රතීයමාන වන ආකාරය උදාහරණ දෙමින් පහදන්න.

## III කොටස

(06) පහත සඳහන් වගුවේ I, II, III යන කොටස් ප්‍රයෝජනයට ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙනම පිළිතුරු සපයන්න.

| I කොටස | II කොටස | III කොටස |
|---|---|---|
| ඇනාපාවලෝවා | නිදිකුමාරි | මාර්තා ග්‍රැහැම් |
| ගලීනා උලනෝවා | හංසවිල | ජීන්ජෝර්ජ් නොවර්වේ. |
| තමාරාකර්වනෝවා | ගිසෙල්ලි | කාලෝ බ්ලැසිස් |
| මාරියස් පෙටිපා | මිය ගිය හංසයා | මයිකල් ෆෝකින් |

i. හංස විල බැලේ නාට්‍යයේ දීර්ඝ කාලයක් රඟපෑ ශිල්පිණිය නම් කර හඳුන්වන්න.

ii. 19 සියවසේ රුසියාවේ බෝල්ෂෝයි රඟහලේදී එළිදැක්වූ බැලේ නාට්‍ය නම්කොට එය ජනප්‍රිය වීමට තුඩුදුන් කරුණු සාකච්ඡා කරන්න.

iii. බැලේ නාට්‍යයේ ප්‍රවර්ධනයට දායකත්වය ලබා දුන් 'නර්තනයේ පියා' නම් කොට ඔහුගේ සේවය අගයන්න.

(07) භාරතීය නර්තන කලාව සංගීතය හා බද්ධව ආගමික පසුබිමක් මත ගොඩනැගුණකි.

i. භාරතීය නර්තන සම්ප්‍රදායන්ගේ විකාශනයට බලපෑ සාධක විස්තර කරන්න.

ii. භරත නාට්‍යම් හෝ කථකලි නර්තන සම්ප්‍රදායන්හි ප්‍රවර්ධනය සඳහා පුරෝගාමී වූ නර්තන ශිල්පීන් දෙදෙනෙක් හඳුන්වන්න.

iii. කථක් මුද්‍රා නාට්‍යය දේශීය මෙන්ම විදේශීය නර්තන සම්ප්‍රදායන්ගෙන් පෝෂණය වී ඇති අයුරු උදාහරණ මගින් පෙන්වා දෙන්න.

## IV කොටස

(08).

i. වේදිකා ආලෝකකරණයේදී වර්ණ සංයෝජනය පිළිබඳ මැක්ස්වෙල් වර්ණ ත්‍රිකෝණය දක්වන්න.

ii. වෙස් මෝස්තර නිර්මාණකරණයේදී යොදා ගන්නා ශිල්පීය ක්‍රම පිළිබඳ විස්තර කරන්න.

iii. ප්‍රාසාංගික වේදිකාව තුල නර්තන නිර්මාණයක් සඳහා විදුලි ආලෝකය සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු භාවිත අනුශාංගික අංග උදාහරණයට ගනිමින් විස්තර කරන්න.

(09).

i. රූපවාහිනී නර්තන වැඩසටහන් නිෂ්පාදනයේදී "දේශීය සංස්කෘතික හර පද්ධති ආරක්ෂා කල යුතුයි" යන්න පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

ii. චිත්‍ර කලාව හා බැඳි මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අයුරු විමසුමට ලක් කරන්න.

iii. පාසල් විෂයමාලාවට නර්තන විෂය ඇතුලත්වීම මගින් නර්තන කලාවෙහි සිදු වූ නවප්‍රවණතා අගයන්න.



www.Artsapi.lk
Scanned by CamScanner